# මැතිවරණ කොමිෂන් සභාව

## තනතුරු පුරප්පාඩු

මැතිවරණ කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවතින කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවයේ නියුතු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) තනතුරේ හෝ ඊට සමාන තනතුරක සේවය කරන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රාජකාරි ස්වභාවය** - මැතිවරණ කොමිෂන් සභාවේ හා ඒ යටතේ ඇති සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නව ඉදිරිකිරීම් , වැඩිදියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම් සඳහා වන වැඩ පරීක්ෂා කිරීම සහ ඉදි කිරීම්වලට අදාළ සැලසුම් නිර්මාණය කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම, ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලේඛන පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම හා තනතුරට අදාළව මැතිවරණ කොමිෂන් සභාව හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි කටයුතු.

සටහන - තෝරාගනු ලබන ඉල්ලුම්කරු, ඡන්ද විමසීම් කාල සීමාව තුළ හෝ අන් අවස්ථාවලදී කොමිෂන් සභාව විසින් හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් හෝ පවරනු ලබන සෘජුවම මෙම තනතුරට අදාළ නොවන, මැතිවරණ කොමිෂන් සභාවේ රාජකාරිවල ද නිරත වීමට අවශ්‍යවනු ඇති අතර මැතිවරණ සංවිධාන කටයුතුවල දී මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇති ඉල්ලුම්කරුවන්ට වැඩි ප්‍රමුඛතාවක් දක්වනු ලැබේ.

සෑම ඉල්ලුම්කරුවෙකුම,

I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීමට අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

<u>අයදුම් පත් එවිය යුතු ආකාරය</u>

තමා විසින් ම සකස් කර ගත් ජීව දත්ත තොරතුරු හා සේවා විස්තර ඇතුළත් අයදුම්පතක්, 2023.05.10 දින හෝ ඊට පෙර ලැබෙන සේ **මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය,** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස **"මැතිවරණ කොමිෂන් සභාවේ කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා අයදුම් කිරීම"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

2023.05.10 දිනට හෝ ඊට ප්‍රථම අයදුම්පත් යොමු කරන සියළුම අයදුම්කරුවන් මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් අනතුරුව මෙම තනතුර සඳහා සුදුසු අයෙකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවසාන තීරණය මැතිවරණ කොමිෂන් සභාව සතු වන අතර, සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,**

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්

2023 අප්‍රේල් මස 25 දින
මැතිවරණ මහලේකම් කාර්යාලය,
සරණ මාවත,
රාජගිරිය.